


# කවදත් කාහටත් ගැලපෙන විශ්ව සාධාරණ දහම

(අඞගුතතර නිකායේ කාලාම සූත්‍රය ඇසුරිනි.)

සද්ධම්කාමී පින්වතුනි,

අද නිකිණි පුර පෝ දිනයයි. බෞද්ධ භික්ෂූන් වහන්සේලා මෙම වසරේ පෙරවස් එළඹීම සහ ශාසන ඉතිහාසයේ ප්‍රථම ධම් සංඝයනාව පැවැත්වීම වැනි වැදගත් කරුණු සිදුවීමට පාදක වූයේද අද වැනි දිනයකි.

අද මෙම දහම් පණිවුඩය සඳහා පාදක කරගත් ධම් මාතෘකාව 'කාලාම සූත්‍රයයි'

ශ්‍රී සඬම්වක්‍රවතීති වූ භාග්‍යවතුන් වහන්සේ එක් කලෙක කොසොල් රට චාරිකා කරද්දී කාලාම ක්ෂත්‍රියයන්ගේ කේසපුත්ත නම් වූ ගමට වැඩම කළේය. ඒ පිළිබඳව සතුටින් කාලාම වැසියන් 'ඉතිපිසො භගවා...'' යනාදී ගාථාවෙහි අඩංගු බුදුගුණ නවය සිහිගන්වා 'ගොතමං එවං කලයාණො කිතතිසදෙදා අබභුගගතො'' ඒ භාග්‍යවතුන් වහන්සේ පිළිබඳව මෙබඳු යහපත් කීර්තී ශබ්දයක් උසස් ලෙස පැන නැග ඇත. එබඳුවූ රහතුන්ගේ දැකීම ඉතා යහපත් යයි කාලාම වැසියන් භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණිය හ. ඒ පැමිණි කාලාම ක්ෂත්‍රියයෝ ඉතා ඥාණවන්තයෝ බැවින් නිසි වචන ආදියෙන් සතුටු කථා කොට එකත් පසෙක හුන් හ.

එසේ සිටියා වූ ඔවුන් මේ අදහස බුදු හිමියන්ට ඉදිරිපත් කරනව. ''ස්වාමීනි ! මේ කේසපුත්ත ගමට එන හැම භවත් මහණ බමුණෙක්ම තම දහමම කියති . ලෝවැසියන්ගේ වෙනත් ආගම් දහම් හෙළා දකිති. බැහැර කරති. ඒ නිසා ස්වාමීනි මේ මහණ බමුණන් අතරින් කවරෙක් අපිට සත්‍ය කියනවා ද? කවරෙක් බොරු කියනවා ද? අපිට මෙය සැකයට විචිකිත්සාවට හේතුවේ මෙය පහදා දෙන්න.'' යයි පැවසීය.

එවිට භාග්‍යවතුන් වහන්සේ කිසිදු ශාස්තෘවරයෙකු නොදැරූ තිසරණ ගත නොගත කවදත් කාටත් ගැලපෙන න්‍යායක් ඉදිරිපත් කරනව. එම න්‍යාය විශ්ව සාධාරණ ඉතා අපූරූ න්‍යායක් මේ කාලාම සූත්‍රයෙන් අපිට ඇති කරගන්න තියන එකම දහම් දැනුම වන්නේ ද එම ධම් න්‍යායයි.

එම උතුම් සර්වඥ බලයෙන් යුතු න්‍යාය මේ වන විට ඇතැමුන් තම වාසියට ද ගෙන කථා කරන කාලයක මේ කාලාම සූත්‍රයෙන් එදා පැහැදිළිව දේශනා කළේ කුමක් ද? යන්න මෙයින් ඉගෙන ගනිමු.

කාලාමයෙනි තොප විසින් නිසි තැනදී සැක කිරීම විචිකිත්සා පහළකිරීම වරදක් නොවේයයි වදාරා විශ්ව සාධාරණ ධම් පයර්‍යායක් ඉදිරිපත් කරනව.

01. ''එථතුමෙහ කාලාමා මා අනුසසවෙන'' ආරංචියෙන් නොපිළිගනිව් .. 02. ''මා පරමපරාය '' පරම්පරාවට ආව නිසා නොපිළිගනිව් 03. ''මා ඉතිකිරාය'' ''මෙය මෙසේ වෙනවාළු යයි''අනුන්ගෙන් දැනගෙන නොපිළිගනිව් 04. 'මා පිටක සමපදානෙන'' අපගේ ධර්‍මයේ පිටකයේ සම්ප්‍රදායේ තියන නිසා ය යි නොපිළිගනිව් 05. 'මා තකකහෙතු' තර්‍කයට හරියයි නොපිළිගනිව් 06. 'මා නය හේතු' ක්‍රමයට න්‍යායයට හරියයි නොගනිව් 07. 'මා ආකාර පරිවිතකෙකන' පෙනෙන්නාවූ පිහිටීම අනුව සුන්දරයයි නොපිළිගනිව් 08. මා දිටඨි නිජකඛානකඛනතියා' අප ප්‍රිය කරන දෘෂඨිය සමග සැසඳෙනවායයි නොපිළිගනිව්. 09. මා හබබරූපතාය '' මොහු පූජ්‍යයෙකියි ඒ නිසා නොපිළිගනිව්. 09. මා සමණො ගරූති' මේ අපගේ ගුරුවරයාය ඒ නිසා පිළිගනිමු යි නොගනිව් යනුවෙන් කෙටියෙන් මෙසේ වදාරා. කාලාමයෙනි මේ දහම් කුසල්ය මෙය අකුසල්ය මෙය වරදකි මෙය නුවණැත්තන් විසින් ගරහන ලද්දකි. මේවා සපුරන්නාට අවැඩ පිණිස දුක් පිණිස පවතිනවා යි තොප විසින් යම් මොහොතකදී දැන ගනීද? කාලාමයෙනි ඒ අවස්ථාවේදී එම වැරදි දුරුකරව' යනුවෙනි.

ඉන්පසු සත්වයා සසර ගමන් කරවා දුකට පත් කිරීමට හේතුවන අකුසල මූලයෝ සම්බන්ධකර හරි කුමක්ද වැරදි කුමක් දැයි තේරුම් කිරීමට කාලාමයන් සමග භාග්‍යවතුන් වහන්සේ සහේතුක ප්‍රශ්න උත්තර ක්‍රමයක් උපයෝගී කරගෙන 'කාලාමයෙනි ලෝභය (වස්තුකාමයන් කෙලෙස් කාමයන්ට ඇති ආසාව) දෙවෂය (තරහ) මෝහය (මෝඩකම) හෙවත් සත්‍ය නොදැකීම යම් පුරුෂයකුගේ සිතතුළ උපදනුයේ ඔහුට වැඩ පිණිස ද? අවැඩ පිණිස ද'අහිතාය හනෙත' ස්වාමීනී අහිත පිණිසයි. එසේ නම්, කාලාමයෙනි! ලෝභයෙන් ද්වේශයෙන් මෝහයෙන් යුක්ත වූ ඔහුට බොහෝ කලක් එයම අහිතට දුකට හේතුවේ නම් ඒ ආකාරයෙන් ඒ සිතින් ඔහු ඕ ප්‍රාණඝාත (පරපණ නැසීම) ඕ හොරකම (අන්සතු දේ ගැනීම)- ඕ පරදාර සේවනය (කාමයෙහි වැරදි හැසිරීම) ඕ මුසාවාද (බොරුකීම) කරමින් ඔහු විසින් අනුන්ද එම පවෙහි යොදවයි නේ ද? 'එවං හනෙත' එහෙමයි ස්වාමිනී !.

කාලාමයෙනි ඔබ කුමක් හිතනවාද? එසේ කරයි නම් මේවා කුසල් ද? අකුසල් ද? ස්වාමිනී! අකුසල් (අකුසලා හනෙත) (සාවජජාවා අනවජජාවාති=) දොස් ඇත් ද? නැත්ද? සාවජජා හනෙත'' දොස් සහිතයි ස්වාමීනි) නුවණැත්තන් විසින් ගරහාද? නොගරහාද? ''විඤ්ඤුගරහිතා හනෙත'' නුවණැත්තන් ගරහනවා ස්වාමීනි! කාලාමයෙනි මේ අකුසල් අඩු නැතිව සම්පූර්ණ කර හෝ සමාදන් කොට (භාරගෙන) ගන්නා ලද්දේ නම් ඔහුට වැඩ පිණිස වේද? අවැඩ පිණිස වේද? දුක් පිණිස වේද? නැතිනම් එසේ නොපවතී ද? ඔබට මොනවිදියට මෙය අදහස් වේද? ස්වාමිණී එසේ ලද්දහුට අවැඩ පිණිස දුක් පිණිස පවතිනවා යයි අපට වැටහේ.

ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ එම ප්‍රශ්නෝත්තර ක්‍රමය උපයෝගී කරගෙන ඉහත මුලදීම කියනලද දස වැදෑරුම් විශ්ව සාධාරණ ධර්‍ම න්‍යාය නැවත කුසලයේ පැත්තට ද සිහිපත් කරමින්.

කාලාමයෙනි යම් කලෙක ඔබලා මේ දහම් කුසල් ය මේ දහම් අකුසල් ය මේ දහම් නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දේ ය. මෙය සම්පූර්ණ කොට සමාදන් කොට ගන්නා ලද්දේ වැඩ පිණිස සුව පිණිස පවතිනවා යයි තමන්ම දැන ගන්නේ නම් එකලට ඔබලා එම යහපත් දහම් සම්පාදනය කරගෙන වාසය කරව් ! යනුවෙන් වදාරා. කාලාමයෙනි! ඔබලා කුමක් සිතන්නේ ද යමකුගේ සිත තුළ අලෝභය අදෙවශය අමෝහය උපදින්නේ නම් එය හිත පිණිස ද අහිත පිණිස වේද ? වහන්ස හිත පිණිස වේය.

එසේ නම්, පින්වත් කාලාමයෙනි යමෙකුගේ සිත ලෝභයෙන්, දෙවෂයෙන්, මෝහයෙන් නොමැඩනා ලද සිත් ඇත්නම් ඔහුට දීර්‍ඝ කාලයක් හිත පිණිස සුව පිණිස වේ නම් එබඳු වූ ප්‍රාණඝාතාදිය ඔහුගෙන් නොකෙරේ. ලෝකයා ද ඒ ලෙසට යහපතෙහි සමාදන් (යොමුකරයි) කරවයි. එසේය ස්වාමිනී!

පින්වත් කාලාමයෙනි ඔබලාට කුමක් සිතේ ද? යමෙකුගේ සිත තුළ මේ ධර්‍මයෝ පහළ වේ නම් ඒවා මොනවාද? කුසල්ද ? අකුසල් ද?ස්වාමීනි කුසල් වෙති. දොස් සහිතද? (සාවද්‍ය) දොස් රහිතද (අනවද්‍ය) ස්වාමීනි, අනවද්‍යවෙති.

නුවණැත්තන් විසින් ගරහන ලද ද?, ප්‍රශංසා කරන ලද ද?, ස්වාමීනි නුවණැත්තන් විසින් ප්‍රශංසා කරනු ඇත.

පින්වත්, කාලාමයෙනි මේ කුසල් දහම් පරිපූර්ණ කොට සමාදන් කොට ගත්තේ නම් සැපයට වැටේ ද? දුකට වැටේ ද? ඔබලාට කෙසේ අදහස් වේද? ස්වාමීනි, හිත පිණිස, සැප පිණිස හේතුවනවායි අපිට හැඟේ.

එසේ නම් , පින්වත් කාලාමයෙනි , (ඉහත මුලදී කී ආකාර දහය නැවත සිහිපත් කොට) එසේ නොදරා යම් කළෙක මේවා කුසල් ය නිවැරදිය නුවණැත්තන් විසින් ප්‍රශංසාත්මකය. අඩු නැතිව පරිපූර්ණව පිහිටුවාහු ද ඔහුටම හිත පිණිස, සැප පිණිස හේතුවෙති යි තමන්ම දැනගන්නේ නම්, ඔබලා විසින් ඒ යහධම් සම්පාදනය කරගෙන වාසය කරව් යනුවෙන් වදාළ හ.

එසේ වදාල වූ භාග්‍යවතුන් වහන්සේ පින්වත් කාලාමයෙනි, ඒ ආයර්‍ය ශ්‍රාවක වනාහී මෙසේ ලෝභය දෙවෂය, මෝහය දුරුකොට නුවණින් දැන. මෙත්තා කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බඹ විහරණයෙන් සතර දිශාවද, උඩ යට ආදී සැම තැනම සියලු ලෝකයා කෙරෙහි අප්‍රමාණව සර්‍වාත්මතාවෙන් (=සබබතතතාය සබබාවනතංලොකං) එනම්, හීන මධ්‍යම උසස් සතුරු, මිතුරු, ස්ත්‍රී පුරුෂාදී , ප්‍රභේද ඇති සියලු සත්වයන් කෙරෙහි ආත්ම සමතාවයයි 'හෙවත්' තමා හා සමාන කොට මෙත්තාදී බ්‍රහ්ම විහරණ කිරීමයි. මෙසේ දියුණුවට පත් කලා වූ සිතින් යුතු ආයර්‍ය ශ්‍රාවක වනාහී ලෝභ, දෙවෂ, මෝහ දුරුකොට එළඹ සිටි සිහියෙන් යුතුව නිදුක්ව උපේක්ෂා සහගතව වාසය කරයි.

පින්වත් කාලාමයෙනි, ඒ ආයර්‍ය ශ්‍රාවකයා විසින් මේ ආත්මයේදීම සතර ආස්වාදයක් ලබයි. (=චතතාරො අසසාසා අධිගතා හොනති) යනුවෙන් වදාළහ. මෙහි "අසසාසා" යනු අස්වැසීමයි. සැනසීමයි, එම සැනසීම කවුරු ලැබුවත් ඒකාන්ත සැනසීමකි. එමෙන්ම කාහටත් සාධාරණ සැනසීම් (අස්වැසීම්) සතරකි. කාලාම සූත්‍රයෙන් භාග්‍යවතුන් වහන්සේ ඉගැන්වූ ධර්‍ම න්‍යාය ඉබේටම පිළිගැනීමට සිදුවන සහේතුක කර්‍ම ධර්‍මතාවයයි. එනම්,

ඔමේ අනුව යම් හෙයකින් මාහට පරලොවක් වේනම් කුසල් අකුසල් වල කර්‍මපල විපාකයන් වේ නම් මරණින් මතු පඤ්චකාම සම්පත්තීන්ගෙන් මනාකොට අග්‍රවූ දිව්‍යමය වූ ශෝභන ගති ඇති සවර්‍ග ලෝකයට (දෙව්ලොව) යන්නෙමියි. පළමු ප්‍රතිෂ්ඨාව හෙවත් අස්වැසීම ඇතිවේ.

ඔයම් හෙයකින් පරලොවක් නැතිනම් කරන්නා හට කුසල් අකුසල් විපාක නොලැබේ නම්, මම මේ ඉහාත්මයේ දීම වෛර නැති වූ, පීඩා නැති වූ, දුකින් තොරවූ සැපවත් වූ ආත්මයක් පරිහරණය කරමි යන මේ දෙවෙනි අස්වැසීම හෙවත් ප්‍රතිෂ්ඨාව විඳී.

ඔයම් හෙයකින් කරන්නා හට පවුවල විපාක ලැබේනම් ඒවා අනිෂ්ඨ විපාකයෝය . මම එවැනි විපාක ලැබෙන පවු කමක් කිරීම තබා නොසිතමි. එසේ පවක් නොකරන මා කෙසේ දුකක් විඳීමක් ස්පර්ශ කිරීමක් කරන්නේදැයි යන මේ තුන් වැනි අස්වැසීම ලබන ලද්දේ වේ.

ඔ යම් හෙයකින් පව් කරන්නාහට විපාක වශයෙන් අනිටු විපාක දීමක් නොලැබේ ද එසේ වුවද මම පවු නොකරන බැවින් මට කමක් නැත. බියක් නැත. දුක් විපාක කොහෙන් ලැබේ ද? ඒ කියන දෙකරුණින්ම මම පිරිසිදු වෙමි. මේ සතර වෙනි අස්වැසීමයි.

ඇතත් නැතත් පරලොව සුදනෙනි මහත<br>
හළොත් යෙහකි පව්කම් නොතබා ම සිත<br>
නැතොත් එ පරලොව ඉන්වන අවැඩ නැත<br>
ඇතොත් නැතැයි පව් කළහට වෙයි විපත

අලගියවන්න මුකවෙටිතුමා එසේ කීවේද මේ අදහසමයි.

මෙම සූත්‍ර දේශනාව එදා කාලාම වාසීන්ට මෙන්ම අද ජීවත්වෙන අපිට ද ඉතා කාලෝචිතවේ. අති පුරාණයේ පටන් කිසිදු දහමක ශාස්තෘවරයෙක් ශ්‍රාවකයාට නිදහස්ව කල්පනා කොට යමක් නිශ්චය කරගැනීමේ අවස්ථාවක් දී නැත. මේ කාලාම සූත්‍රයෙන් ඒ සවණීමය ද්වාරය විවෘතකර ගැනීමට අවසර දී ඇත. ඒ බව සූත්‍රය ගලායන ආකාරය අනුව තේරුම් ගත හැකිය. කාලාම වාසීන් එය පිළිගැනීමට ද හොඳ විචාර බුද්ධියකින් සිටිය බව පැහැදිලි වේ. විශ්ව සාධාරණ ධර්ම න්‍යායක් භාග්‍යවතුන් වහන්සේ එදා ඉදිරිපත් කර ඇත්තේ කාලාම වාසීන්ගේ බුද්ධිය අබිබවා නොව ඔවුන්ගේ බුද්ධිය උපයෝගී කරගෙන, සැක නොතබාය. එහෙත් වෙනත් කිසිදු ආගමකට දහමකට අබමල් රේණුවක් තරම් හානිදායක අදහසක් ඉදිරිපත් කර නැතිබව අවසානයේදී ඉදිරිපත් කරන අස්වැසීම් හතර මගින් තවදුරටත් තහවුරු කරයි. ඕනෑම භෞතික වාදී අදහස් දරන්නෙකුට වුවද උන්වහන්සේගේ ධර්ම න්‍යායට එකඟ නොවී පිටුපෑමට ඉඩක් තබා නැත.

භාග්‍යවතුන් වහන්සේ කාලාම වාසීන්ට සූත්‍රයේ මුලදීම, ආරංචියෙන්, පරම්පරාවෙන් ආදී වශයෙන් නොගනිව් යනුවෙන් දේශනා කරන කරුණු දහය අද ඇතැමුන්ගේ නොදන්නාකම නිසා එකින් එක භාවිතා කරමින් තමන්ගේ වාසියට ද යොදා ගනී, එසේ කිරීමට හේතුව වන්නේ බුද්ධ දේශනාව පිළිබඳව හරි අවබෝධයක් නොමැතිකමයි. එදා කාලාම වාසීන්හට බුදුරජාණන් වහන්සේ පිළිබඳව වෙනත් ශාස්තෘවරුන් කෙරෙහි නොතිබූ උසස් වූ කීර්ති ශබ්දයක් තිබූ බවට විශ්වාසයක් " තංඛොපන භගවනතං ගොතමං එවං කල්‍යාණො කිතති සදෙධා අබභුගගතො..." යනාදී පාඨයෙන් දැක්වේ. ඒ වෙන කිසිදු ගුණ ඝෝෂාවක් නොවේ. 'ඉතිපිසො භගවා... " යනාදී නව මහා ගුණ ඝෝෂාවයි. කීර්ති යයි ඒ දැනුම අද ජීවත්වන අපතුළ අඩු නම් කාලාම සූත්‍රයද නුහුරට භාවිතා කිරීමට පෙළඹේ. සත්‍ය සොයා ගැනීමේදී සර්වඥ ධර්මයෙහි ස්වකීය බුද්ධිය මෙහෙයා කරුණු වටහා ගැනීමට අවකාශ ලබාදුන් සවණීමය දේශණාව ලෙස මෙම කාලාම සූත්‍රය දැක්විය හැකිය.

බුද්ධ ධර්ම විෂයෙහි දැනුම ඇතිකර ගැනීමට භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ ඉහතින් දැක්වූ නව මහා ගුණ මෙන්ම නව ලෝකෝත්තර ධර්මයේ සයක් වූ මහා ගුණ පිළිබඳව අල්පමාත්‍රව හෝ දැනුමක් තිබිය යුතුය. භාග්‍යවතුන් වහන්සේ කාලාම සූත්‍රයෙන් සත්වයා වෙත දුන් අර්ථය එහි අඩංගු බව 'සද්ධර්මයේ' ගුණ කෙටිකර සිහිකරන විටම දැනේ.

ඔභාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාසේ වදාරණ ලද්දේය. (සවාකඛාතො භගවතා ධමෙමා)
ඔ තම සිතෙහි රාගාදී කෙලෙස් නැතිකර තමා විසින් දැක්ක යුතුය. (සනදිට්ඨිකො)
ඔ තම පැවැත්මට අනතුරුව විපාක දීමට කාලාන්තරයක් ඇත්තේ නොවේ. (අකාලිකො)
ඔ සවභාවයෙන්ම විද්‍යමාන වන හෙයින් "එව බලව" යි කියන්නට සුදුසුය. (එහිපසසිකො)
ඔ භාවනා වශයෙන් තම සිතෙහි යෙදවීමට ප්‍රත්‍යක්ෂ කිරීමට (උපනෙය්‍ය කිරීමට) සුදුසුය. (ඔපනයිකො)
ඔ අනුන් හිස පැළඳි ආභරණයක් තමන් දකින මෙන් නොදැක්ක හැකිය තම සිතෙහි තම බුද්ධියෙන්ම නිදහස් ලෙස කල්පනා කොට තීරණය කරගත යුතු වූ හෙයින් (පචචතතං වෙදි තබෙබා විඤ්ඤූහි" )

කාලාමවාසීන්ට මේ මහා ධර්ම ගුණහය සූත්‍රය අවසානයේ දී ආශ්චර්‍යය ලෙස විනිවිද පෙනින. සූත්‍ර අර්ථය ධර්මයේ ගුණ හයෙන් පෙනින. එදා ඔවුන්ට එසේ පෙනුනද අද ඇතැමුන් පංචශීලයට ද විකෘති අර්ථ දීමට උත්සාහ දරති.

පසුගිය දිනක මාධ්‍ය නාලිකාවක් තුළින් දේශපාලන අදහසක් දැක්වූ එක්තරා පුද්ගලයෙක් පැවසුවේ අද ඇතැමුන් "පාණාති පාතා වේරමණී සික්ඛාපදං " යනාදී සිල්පද පහෙන් කියවෙන පවුපහ "වේ රමණී" (රමණීය වේ) යනුවෙන් අර්ථ දක්වමින් කරන බවයි. විනෝදයට උපහාසයට අපහාසයට වාසියට කිව්වත් ලොවුතුරු ධර්මය රාජ ආඥාවකට වඩා බලවත් බව බියෙන් නොව ධර්ම ගෞරවයෙන් සැලකිය යුතු ය.

එදා කාලාම වාසීන්ට දැනුනේ මේ ධර්මයේ ආශ්චර්‍යයයි. ඒ ආශ්චර්‍යය අපද තේරුම් නොගන්නාතාක් සද්ධර්මය නොව කාලාම සූත්‍රයෙන් කියනුයේ කුමක් දැයි වත් නොවැටහෙනු ඇත.

මෙම සූත්‍රයේ කිසිදු තැනක භාග්‍යවතුන් වහන්සේ විසින් කීවත් නොපිළිගත යුතුයි යනුවෙන් උන්වහන්සේ දේශනා කර නැති බව ද තම බුද්ධියෙන්ම වටහා ගත යුතුයි.

අධිකතර චිත්ත ප්‍රසාදය පහළ කරගත් කාලාම වැසියන් එදා මෙසේ ප්‍රතිඥා දුන්හ. භවත් ගෞතමයන් වහන්ස, ඉතා හොඳයි! යටිකුරු යමක් උඩුකුරු කළා සේ, වැසූ යමක් විවරකළා සේ, මංමුලා වූවකුට මග කිව් සේ, ඇස් ඇත්තෝ රූප බලත්වායි! අඳුරෙහි පහනක් දැල්වූවා සේ , නානා ප්‍රකාරයෙන් ඔබ වහන්සේ ධර්මය දේශනා කරන ලද්දේ ය.

ස්වාමීනි! අපි භාග්‍යවතුන් වහන්සේ ද සපයර්‍යාප්තික නව ලොකෝත්තර ධර්මය (සතර මග සතර ඵලය නිර්වාණය) ද අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝයා වහන්සේ ද සරණ යම්හ. අප රතනත්‍රය සරණ ගත උපාසකයන් කොට දරණ සේක්වා යි කාලාමයන් විසින් ප්‍රකාශ කළ බැව් සූත්‍රයේ දැක්වේ.

මේ සූත්‍ර දේශනයට අනුව වත්මන් ලෝකයේ සද්ධර්මය පරිහරණය කරන බෞද්ධයින් වශයෙන් එදා කාලාමවාසී ගිහියන් ආදර්ශයට ගතයුතු කාලය පැමිණ ඇත. බුදු දහමේ වාද විවාද නැත. දහමේ තිබෙන පෙළ පාලි විනා වෙනත් පෙළපාලි නැත. බුද්ධියට ඉඩ දී ධර්මය විකෘති සහ අවලංගු නොකර. පැරණි ධර්මධර විනයධර ගිහි පැවිදි උතුමන් ආදර්ශ කොට තම බුද්ධිය මෙහෙයවා දෙලොව අභිවෘද්ධි සාධනය කරගැනීමට අදිටන් කරගනිමු.